# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2097/16 – 2018 නොවැම්බර් මස 14 වැනි බදාදා – 2018.11.14**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

බස්නාහිර පළාත් සභාවේ සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්ති කෙටුම්පත පහතින් සඳහන් කරමි.

**කැප්ටන් ලලිත් වනිගරත්න,**
බස්නාහිර පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර,
සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්,
කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍ය.

2018 සැප්තැම්බර් මස 26 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ අංක 204 හි
බස්නාහිර පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර,
සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්,
කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශයේ දී.

1A – PG 4311 – 307 (2018/11)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## බස්නාහිර පළාතේ පළාත් සභාවේ සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය

බස්නාහිර පළාතේ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවක් ඇති කිරීම සඳහා ද, බස්නාහිර පළාතේ සමුපකාර සමිති සේවකයින් සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන සැලැස්වීම සඳහා ද, ඊට සම්බන්ධ වූ හා අනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද, බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1994 වර්ෂයේ අංක 01 දරන සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහා විධිවිධාන සැලසීම පිණිස වූ ප්‍රඥප්තියකි. මෙම ප්‍රඥප්තිය 1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතට අනනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

*ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.*

1. මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2018 අංක ............ දරන සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලද දින සිට ක්‍රියාත්මක වන්නේය.

### I කොටස

### බස්නාහිර පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාවේ සංස්ථාපනය, බලතල සහ කාර්යයන්

*සමුපකාර සේවක කොමිෂන් සභාව පිහිටුවීම.*

2\. (1) මෙහි මින්මතු ''කොමිෂන් සභාව'' යනුවෙන් සඳහන් කරනු ලබන බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවක් මෙයින් සංස්ථාපනය කරනු ලැබේ.

(2) කොමිෂන් සභාව (1) උපවගන්තිය අනුව නියමිත නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති, නඩු පැවරීමට හා නඩු පවරනු ලැබිය හැකි සංස්ථාපිත ආයතනයක් වන්නේය.

*කොමිෂන් සභාවේ සංයුතිය.*

3\. (1) කොමිෂන් සභාව අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත සඳහන් සාමාජිකයින් තිදෙනාගෙන් සමන්විත විය යුතුය.

(අ) ශ්‍රී ලංකා පරිපාලන සේවය විශ්‍රාම ලත් තැනැත්තෙකු,

(ආ) ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරයෙකු,

(ඇ) රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක හෝ රජයට අයත් මණ්ඩලයක හෝ විධායක මට්ටමේ විශ්‍රාමික නිලධාරියෙකු.

(2) ඉහත 1(අ) උපවගන්තිය යටතේ පත් කරනු ලබන සාමාජිකයා කොමිෂන් සභාවේ සභාපති වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කළ යුතුය.

(3) ඉහත (1) හා (2) උපවගන්ති යටතේ කරන ලද පත් කිරීම් අධිකරණයේ දිවුරුම් දුන් දින සිට බලාත්මක වන පරිදි ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

*සාමාජිකයෙකු වීමට නුසුදුසුකම්.*

4\. යම් තැනැත්තෙකු,

*(අ)* සමුපකාර සමිතියක නිලධරයෙකු, සේවකයෙකු හෝ හිටපු නිලධරයෙකු, සේවකයෙකු නම් හෝ,

*(ආ)* යම් සමුපකාර වෘත්තීය සමිතියක සාමාජිකයෙකු වේ නම් හෝ සමුපකාර සමිතියක් වෙනුවෙන් සේවයේ යෙදෙන වෙනත් යම් කවර ආයතනයක වැටුපක් හෝ වේතනයක් ලබන්නෙකු නම් හෝ,

*(ඇ)* පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු, පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වන්නේ නම් හෝ ක්‍රියාකාරී දේශපාලනට සම්බන්ධ තැනැත්තෙකු නම් හෝ,

(ඈ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවන්නේ නම් හෝ,

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බල පවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තෙක් බවට තීරණය කර ඇත්නම් හෝ ප්‍රකාශ කරනු ලැබ ඇත්නම් හෝ,

(ඊ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් සපරාධි වරදකට අදාළව වරදකරුවෙකු වී සිටීනම් හෝ සිටියේ නම් හෝ,

(ඔ) මෙම ප්‍රඥප්තියේ 6 වන වගන්තිය යටතේ ඉවත් කල සාමාජිකයෙකු හෝ සාමාජිකත්වය අහෝසි වූ අයෙකු වේ නම් හෝ,

එවැනි තැනැත්තෙකු කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ කටයුතු කිරීමට නුසුදුස්සෙකු වන්නේය.

*සාමාජිකයෙකුගේ ධුර කාලය.*

5. (1) කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකුම, ඔහු පත් කරනු ලැබූ දිනයෙහි සිට අවුරුදු තුනක් නොඉක්මවන කාලයක්, ධුරය දැරිය හැකිය. තවද, 6 (1) උප වගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරන ලද්දේ නම් මිස, නැවත පත් කරනු ලැබීමට නුසුදුස්සෙකු නොවිය යුතු ය.

(2) සාමාජිකයෙකු ධුරයෙන් ඉවත් කරන ලබන අවස්ථාවකදී හෝ ඉල්ලා අස්වන අවස්ථාවකදී නැවත පත් කරන සාමාජිකයා විසින් ඉතිරිව ඇති ධුර කාලය සඳහා පමණක් ධුරය දැරිය යුතුය.

(3) රෝගාතුරවීමකින් හෝ වෙනත් අබලතාවයක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හේතුවෙන් හෝ තම ධුරයේ කාර්යය ඉටු කිරීමට සාමාජිකයෙකුට තාවකාලිකව නොහැකි වුවහොත් සාමාජික ධුරයේ වැඩ බැලීම සඳහා අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවට සාමාජිකයෙකු පත් කළ හැකිය.

6. (1) අමාත්‍යවරයා විසින් කවර හෝ සාමාජිකයෙකුගේ ක්‍රියා කලාපය පිළිබඳ සෑහීමකට පත් නොවන විට සාමාජිකයකුගේ පත්වීම අවසන් කරනු ලැබිය හැකිය.

(2) ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා වෙත යවන ලද ලිපියක් අමාත්‍යවරයා පිළිගත් බව දැනුම් දීමෙන් අනතුරුව කොමිෂන් සභාවේ සාමාජිකයකුට, සාමාජිකයෙකු වශයෙන් වූ හෝ සභාපති වශයෙන් වූ හෝ ස්වකීය ධුරයෙන් ඕනෑම අවස්ථාවකදී ඉල්ලා අස්විය හැකිය.

(3) අමාත්‍යවරයාගෙන් ලබාගත් විධිමත් අවසරයකින් තොරව අනුගාමී කොමිෂන් සභා රැස්වීම් වාර තුනකට සහභාගි නොවන සාමාජිකයෙකුගේ සාමාජිකත්වය අහෝසි වන්නේ ය.

*කොමිෂන් සභාවේ සභාපති සහ එහි කටයුතු පවත්වාගෙන යාම.*

7. (1) කොමිෂන් සභාවේ සභාපති වශයෙන් පත් කරනු ලබන තැනැත්තා පැමිණ සිටින අවස්ථාවලදී කොමිෂන් සභාවේ සියළුම රැස්වීම්වල දී ඔහු මූලාසනය දැරිය යුතුය. කොමිෂන් සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටියහොත් පැමිණ සිටින සාමාජිකයින් දෙදෙනාගේ එකඟත්වය ඇතිව ඔවුන් අතුරින් එක් අයෙකු විසින් මූලාසනය දැරිය යුතුය.

(2) කොමිෂන් සභාවේ රැස්වීමකට ගණපූරණය සාමාජිකයින් දෙදෙනෙකු විය යුතුය.

(3) කොමිෂන් සභාවේ යම් රැස්වීමකට සාමාජිකයින් දෙදෙනෙකු පමණක් පැමිණ සිටියහොත් හා යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ගත යුතු තීරණය පිළිබඳව සාමාජිකයින් අතර මතය වෙනස් වුවහොත් ඒ ප්‍රශ්නය කොමිෂන් සභාවේ සාමාජිකයින් තිදෙනාම පැමිණ සිටින රැස්වීමක් වෙත යොමු කළ යුතුය.

(4) කොමිෂන් සභාවේ සාමාජිකයින් තිදෙනාම පැමිණ සිටින යම් රැස්වීමක දී යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ගත යුතු තීරණය පිළිබඳව සභාවේ සාමාජිකයින් අතර මතය වෙනස් වුවහොත් ඒ ප්‍රශ්නය පැමිණ සිටින සාමාජිකයින් වැඩිදෙනාගේ මතය අනුව තීරණය කළ යුතුය.

(5) මේ ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගයක නිශ්චිතව විධිවිධාන සලස්වා නොමැති යම් කරුණක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් තීරණය කල හැකි අතර, ඒ සම්බන්ධයෙන් වන තීරණ එම කරුණ සම්බන්ධයෙන් අවසානාත්මක වන්නේ ය.

(6) කොමිෂන් සභාවේ සාමාජිකයින් අතර පුරප්පාඩුවක් තිබීම නිසා හෝ සාමාජිකයින් පත් කිරීම පිළිබඳව අඩුපාඩුවක් තිබීම නිසා හෝ කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක් හෝ කෘත්‍යයක් අවලංගු නොවිය යුතු ය.

සාමාජිකයන්ට ගෙවීම.

8. කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයින්ට පළාතේ මුල්‍ය විෂයභාර පළාත් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයන් හා දීමනා ගෙවිය යුතු ය.

ලේකම් සහ සෙසු නිලධාරීන්.

9. (1) කොමිෂන් සභාවේ ලේකම්වරයෙකු හා ඔහුට සහාය වීම පිණිස කාර්ය මණ්ඩලයක් විය යුතු ය.

(2) කොමිෂන් සභාවේ ලේකම්වරයා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු විය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන් සහ නිලධාරීන් දිවුරුම් දීම.

10. (1) කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් ඔවුන්ගේ පළමු පත්වීමේ දී මේ ප්‍රඥප්තියේ උපලේඛන අංක 1 හි දැක්වෙන ආකෘතිය ප්‍රකාරව වූ දිවුරුමක් අධිකරණයේ විනිශ්චයකාරවරයෙකු ඉදිරියේ ලබා දිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ ලේකම් විසින් හා සෙසු නිලධරයන් විසින් ඔවුන් කොමිෂන් සභාවට පත්වීම් ලැබ එක් මාසයක් ඇතුළත මේ ප්‍රඥප්තියේ උපලේඛන අංක 2 හි දැක්වෙන ආකෘතියෙහි වූ දිවුරුමක් හෝ ප්‍රතිඥා ප්‍රකාශයක් කළ යුතු වේ.

කොමිෂන් සභා කාර්යය මණ්ඩලයේ පත්වීමට නුසුදුසුකම්.

11. කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල සාමාජිකයින් කිසිවෙකුගේ කලත්‍රයා, දෙමව්පියන්, දරුවන් හෝ පවුලේ සාමාජිකයෙකු වශයෙන් කොමිෂන් සභාව විසින් අදහස් කරන කිසියම් ඥාති සබඳතාවයක් ඇති අයෙකු යම් සමුපකාර සමිතියක කිසියම් නිලයක් දරන්නේනම් එම නිලධාරියා හෝ නිලධාරිනිය කොමිෂන් සභා කාර්ය මණ්ඩලයට පත්වීම සඳහා නුසුදුසු වන්නේ ය.

කොමිෂන් සභාවේ බලතල.

12. (1) කොමිෂන් සභාවට පහත සඳහන් බලතල තිබිය යුතු ය:-

*(අ)* සමූපකාර සමිතිවල සේවකයින් බඳවාගැනීමේ ක්‍රමවලට අදළ සියළු කරුණු හා ඔවුන්ගේ සේවා කොන්දේසි ද, පත්කිරීමේ දී හා සමූපකාර සමිතියක එක් තනතුරකින් ඒ සමිතියේ ම තවත් තනතුරකට උසස්කිරීමේ දී සමිති විසින් අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති නිශ්චය කිරීම, එවැනි යම් තනතුරකට පත්කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් නිශ්චය කිරීම.

*(ආ)* (i) සමූපකාර සමිතිවල සේවකයින් බඳවාගැනීම සඳහා විභාග පැවැත්වීම හා ඒ විභාග පැවැත්වීමේ කාර්යය සඳහා පරීක්ෂක මණ්ඩල පත්කිරීම හා විභාගවලට පෙනී සිටින අපේක්ෂකයින්ගෙන් ඊට අදළ ගාස්තු අය කිරීම.

(ii) සමූපකාර සේවකයින්ගේ උසස්වීම් පටිපාටියට අදළ කාර්යය සාධනය මැනීම සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම හා ඒ වෙනුවෙන් පරීක්ෂණ මණ්ඩල පත්කිරීම හා ඊට අදාළව ගාස්තු අය කිරීම.

(iii) සමූපකාර සේවකයින්ගේ විෂය පථයට අදළ පුහුණු පාඨමාලා වැඩසටහන් සංවිධානය කිරීම, පැවැත්වීම හා ඊට අදළ ගාස්තු අය කිරීම.

*(ඇ)* යම් පන්තියක හෝ එවැනි යම් තනතුරකට හෝ තනතුරුවලට අනුයුක්ත කළ යුතු වැටුප් ක්‍රමය නියම කිරීම, කොමසාරිස් විමසා ඒ වැටුප් ක්‍රම කලින් කළ ප්‍රතිශෝධනය කිරීම හෝ සකස් කිරීම හා සමූපකාර සේවකයින්ගේ පාරිශ්‍රමික හා සේවා කොන්දේසි නිශ්චය කිරීමේ දී කොමිෂන් සභාවට සහාය වීම පිණිස කොමිෂන් සභාව විසින් අවශ්‍යයැයි සැලකිය හැකි උපදේශක කමිටුමක් පිහිටුවීම.

*(ඈ)* යම් පන්තියක හෝ වර්ගයක යම් තනතුරක් හෝ තනතුරු සඳහා කොමිෂන් සභාව විසින් නියම කරන ලද වැටුප් ක්‍රම අනුව වැටුප් ගෙවන ලෙස සමූපකාර සමිතිවලට නියම කිරීම.

(ඉ) (i) සමූපකාර සමිතියක තීරණයකට අදළව සමූපකාර සේවකයින්ගේ අභියාචනා විභාග කිරීම.

(ii) තම සේවයින්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමේ අයිතිවාසිකම් ක්‍රියාවෙහි යෙදවීමෙහි ලා සමූපකාර සමිතියක් විසින් අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය හෝ පරිපාටි නිශ්චය

කිරීම සේවකයින්ට විරුද්ධව විනයානුකූල පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන කාලයක් ඇතුළත දී අවසාන කරන ලෙස සමුපකාර සමිතියකට නියම කිරීම හා යම් සමුපකාර සමිතියක් විසින් කරනු ලැබූ විනයානුකූල නියෝගයකට විරුද්ධව පැන නගින අභියාචනා විභාග කිරීම.

(ඊ) යම් සමුපකාර සමිතියකට එහි සේවකයින්ට අදාළව පවත්වා ගත යුතු සටහන් හා ලේඛන යාවත්කාලීන කර පවත්වා ගත යුතු බවට අවශ්‍ය නියමයන් කිරීම.

(උ) පළාත තුළ ක්‍රියාත්මක වන සෑම සමුපකාර සමිතියක් විසින් ම,

(i) එහි සෑම සේවකයෙකු සම්බන්ධයෙන් නියම කරනු ලබන නාමලේඛන හෝ සටහන් තබා පවත්වා ගෙන යා යුතු බවට හා යම් සේවකයෙකු සම්බන්ධයෙන් නියම කරනු ලැබූ වාර්තා හෝ සටහන් හෝ කොමිෂන් සභාවට අවශ්‍ය යැයි තීරණය කරන විටක එවැනි වාර්තා හෝ සටහන් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට නියම කිරීම.

(ii) යම් සමිති කාර්යාලයකට ප්‍රවේශ වී එහි තබාගෙන යනු ලබන පොත්, ගණන් සටහන් හෝ වෙනත් ලේඛන කිසිවක් පරීක්ෂා කිරීම, එය ඉදිරිපත් කරන ලෙස නියම කිරීම හා කොමිෂන් සභාව බලය දෙන ලද නිලධාරියෙකුගේ භාරයට ගන්නා ලෙස නියම කිරීම.

(ඌ) යම් සමුපකාර සේවකයෙකු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් සම්බන්ධයෙන් හෝ කොමිෂන් සභාව වෙත වාර්තා වන සමුපකාර සේවක ගැටළුවක් සම්බන්ධයෙන් අදාළ සමිති නිලධාරියෙකු, සේවකයෙකු හෝ අභියාචනා පරීක්ෂණයට කැඳවිය යුතු යැයි කොමිෂන් සභාවට හැඟෙන ඕනෑම පාර්ශවයක් ගෙන්වා ඊට අදාළ කරුණු විභාග කිරීම.

(එ) යම් සමුපකාර සමිතියක යම් සමුපකාර සේවකයෙකු සම්බන්ධයෙන් කොමිෂන් සභාවට අවශ්‍ය විය හැකි ලිපිගොනු, වෙනත් ලේඛන හෝ තොරතුරු නිශ්චිතව නියමිත දිනයකට පෙර සපයන ලෙස ඒ සමිතියට නියම කිරීම.

(ඒ) කොමිෂන් සභාව වෙත යොමු කළ අභියාචනා සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ පවත්වා කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම පිණිස නිලධාරීන්ගෙන් සමන්විත අභියාචනා පරීක්ෂණ නිලධාරි හා නිලධාරි මණ්ඩල නම් කිරීම හා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ඊට අදාළ දීමනා ගෙවීම.

(ඔ) යම් සමුපකාර සමිතියක සේවකයෙකුගේ ක්‍රියාකලාපය පරීක්ෂණයකට විෂය වී තිබීම හේතුවෙන් සේවකයා විසින් සමිතියේ තීරණයකට විරුද්ධව කොමිෂන් සභාව වෙත ආයාචනා කර ඇති අවස්ථාවක ඔහු නැවත සේවයට ගැනීම පිළිබඳව උපදෙස් ඇතුළුව ඒ සේවකයා සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් දෙනු ලැබිය හැකි නියෝග ක්‍රියාත්මක කරන ලෙස ඒ සමුපකාර සමිතියට නියම කිරීම.

(ඕ) (i) සේවකයන්ගේ සේවය අවසන් වීමේ දී පාරිතෝෂික හෝ වෙනත් ප්‍රතිලාභ වශයෙන් ඔවුන්ට ප්‍රදානය කළ හැක්කේ යම් සාමාන්‍ය ප්‍රතිපත්ති අනුව ද ඒ ප්‍රතිපත්ති නියම කිරීම.

(ii) හිඟ පාරිතෝෂිත මුදල්, ඇප මුදල්, වැටුප් හා හිඟ වැටුප් හෝ වෙනත් ප්‍රතිලාභ වශයෙන් ඔවුන්ට ප්‍රදානය කළ යුතු යම් දීමනා හා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන යම් වන්දි මුදලක් වේ නම් එය ගෙවන ලෙස සමිතියට නියම කිරීම.

(ක) (i) යම් සේවකයෙකු දරන තනතුර දැරීමට මෙම ප්‍රඥප්තිය යටතේ සාදනු ලබන කාර්ය පටිපාටින්ට අනුකූලව අයෝග්‍ය යැයි කොමිෂන් සභාව තීරණය කරන විටකදී ඊට අනුකූල වූ කවර හෝ නියෝගයක් අදාළ සේවකයාට හෝ අදාළ සමිතියට ක්‍රියාත්මක කරන ලෙස නියෝග කිරීම.

(ii) කොමිෂන් සභාව විසින් ඉහත (i) අනුවගන්තිය යටතේ කරනු ලබන නියෝගයකට අනුකූල වීමට අදාළ සේවකයා අපොහොසත් වන විටක ඊට අදාළ වූ යුක්ති සහගත කල් දීමකින් අනතුරුව අදාළ සේවකයාගේ සේවය අවසන් කරන ලෙසට සමුපකාර සමිතියට නියම කිරීම.

(ග) සමුපකාර සමිතියක සේවකයින් පත් කිරීම, මාරු කිරීම, උසස් කිරීම, විනය පාලනය හා සේවය අවසන් කිරීම ඇතුළු ඊට ආනුෂාංගික කරුණු සඳහා රෙගුලාසි සෑදීම.

(2) ඉහත (1) වැනි උප වගන්තියෙන් කොමිෂන් සභාව වෙත පැවරුනු බලතල ක්‍රියාවෙහි යෙදවීමේදී කොමිෂන් සභාව විසින් කරන ලද යම් තීරණ හෝ නිශ්චය කිරීම්, වෙනස් කිරීම්, ප්‍රතිවර්තනය කිරීම හෝ අවලංගු කිරීම හෝ කොමිෂන් සභාව විසින් කළ හැකිය.

13. කොමිෂන් සභාවේ වියදම් වාර්ෂිකව පළාත් සභාව විසින් වාර්ෂික අයවැය ලේඛනයෙන් සහ පරිපූරක ඇස්තමේන්තු වලින් ඒ සඳහා ප්‍රතිපාදනය කරනු ලබන මුදල් වලින් ගෙවිය යුතු ය.

## II කොටස

### සමුපකාර සමිති සහ ඒවායේ සේවකයෝ

*සමුපකාර සමිතිය සේවායෝජක ලෙස සැලකීම.*

14. යම් සේවකයෙකුගේ වැටුප් හා වෙනත් පඩිනඩි සමිතියේ මුදල්වලින් තත්කාලයෙහි ගෙවන සමුපකාර සමිතියක් ඒ සේවකයාගේ සේවායෝජකයා ලෙස සළකනු ලැබිය යුතුය.

*සමුපකාර සමිති සහ ඒවායේ සේවකයන් කොමිෂන් සභාවේ විධි විධානවලට යටත්විය යුතු බව.*

15. සමුපකාර සමිතියක් හා ඒ සමිතියේ කවර සේවකයෙකු වුවද මේ ප්‍රඥප්තිය යටතේ කොමිෂන් සභාව විසින් කරනු ලැබිය හැකි විධිවිධානවලට යටත් විය යුතු අතර, මේ ප්‍රඥප්තිය යටතේ කොමිෂන් සභාවේ කාර්යයන් හා බලතල ඉටු කිරීමෙහි හා ක්‍රියාවෙහි යෙදවීමෙහි ලා කෙරෙන කොමිෂන් සභාවේ සියළු තීරණ 12 (2) උප වගන්තියේ විධිවිධානවලට යටත්ව අවසානාත්මක විය යුතුය.

*සමුපකාර සමිති සේවක කොමිෂන් සභාවේ විධාන පිළිපැදීමට බැඳී සිටින බව.*

16. යම් සමුපකාර සමිතියක යම් සේවකයෙකු සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් කරනු ලබන සියළු විධිවිධාන 12 (2) උප වගන්තියේ විධිවිධාන වලට යටත්ව අවසානාත්මක විය යුතු අතර, ඒ විධිවිධාන ඒ සමිතිය විසින් කරන ලද්දක් මෙන් ඒ සේවකයා ඒවා පිළිපැදීමට බැඳී සිටිය යුතුය.

*මෙම ප්‍රඥප්තිය නිසා ඇතිවන වෙනස්කම්.*

17. 1994 අංක 01 දරන සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය යටතේ හෝ කවර හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ කරන ලද කවර හෝ නියමයක්, නියෝගයක් මෙම ප්‍රඥප්තිය යටතේ කරනු ලැබූ නියමයක්, නියෝගයක් වශයෙන් වලංගුව බලපැවැත්විය යුතුය.

*පදිංචිය පිළිබඳ සුදුසුකම්.*

18. බස්නාහිර පළාත තුළ යම් දිස්ත්‍රික්කයක සමුපකාර සමිතියක යම් තනතුරකට යටත් පිරිසෙයින් අවුරුදු දෙකක කාලයක්වත් ඒ දිස්ත්‍රික්කය ඇතුළත පදිංචිව නොසිටි කිසිම තැනැත්තෙකු පත් නොකළ යුතුය.

එසේ වුවද කොමිෂන් සභාවේ මතය අනුව යම් දිස්ත්‍රික්කයක යම් සමුපකාර සමිතියක යම් තනතුරක් සඳහා සුදුසු අපේක්ෂකයෙක් එම දිස්ත්‍රික්කය තුළ නොමැති නම්, පළාත තුළ පිහිටි අනිකුත් දිස්ත්‍රික්කවල අයදුම්කරුවන්ගෙන් සුදුසු පුද්ගලයෙක් එම තනතුර පිරවීම සඳහා පත් කිරීමට එම සමිතියට අවසර දීමට කොමිෂන් සභාවට හැකිය.

*පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් ද්විතීයනය කිරීම.*

19. මෙම ප්‍රඥප්තියේ අනෙකුත් විධිවිධානයන් කිසිවක් ගැන නොතකා ඇමතිවරයාගේ එකගත්වය සහ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ද අදාළ නිලධාරියාගේ කැමැත්ත ද ඇතිව බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු සමුපකාර සමිතියක ඕනෑම තනතුරකට කොමිෂන් සභාව විසින් පත් කළ හැකිය. එසේ ද්විතීයනය කරනු ලබන පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකුට එම අරමුණ සඳහා එක් වරකට වර්ෂ දෙක බැගින් උපරිම වාර දෙකක් සඳහා අදාළ සේවා කොන්දේසි අනුමත කිරීමට මෙම කොමිෂන් සභාවට බලය ඇත්තේය.

*සමුපකාර සමිති සේවක වැටුප්.*

20. සෑම සමුපකාර සමිතියක් විසින්ම එහි මුදල් වලින් එම සමිතියේ සේවකයින්ගේ වැටුප් ද, වෙනත් දීමනා කිසිවක් වෙතොත් ඒ දීමනා ද ගෙවිය යුතුය.

21. (1) සමුපකාර සමිතියකට එම සමිතියේ යම් සේවකයෙකු ඒ සමිතියේ එක් සේවා ස්ථානයකින් එහි වෙනත් සේවා ස්ථානයකට මාරු කිරීමේ බලය තිබිය යුතු අතර, විනය හේතු නොවන යම් හේතුවක් නිසා මාරු කිරීම් කරනු ලබන අවස්ථාවක ඒ මාරු කිරීම ඒ සේවකයාගේ පඩිනඩි කෙරෙහි හානිකරව බල නොපෑ යුතු ය. සමුපකාර සමිති සේවක ස්ථාන මාරු.

(2) ඒ ඒ සේවා යෝජකයාගේ එකඟත්වය කලින් ලබා ගෙන ඇත්නම්, සමාන තත්ත්වයේ තනතුරු දරන සේවකයින් දෙදෙනෙකුගේ ඒකාබද්ධ ඉල්ලීම් පිට බස්නාහිර පළාතේ එක් සමුපකාර සමිතියක යම් සේවකයෙකු වෙනත් සමුපකාර සමිතියකට මාරු කිරීමේ බලය කොමිෂන් සභාවට ඇත.

(3) (අ) බස්නාහිර පළාත තුළ සමුපකාර සමිතියක යම් සේවකයෙකු විසින් වෙනත් පළාතක සමුපකාර සමිතියක් වෙත ස්ථාන මාරුවීම සඳහා කරනු ලබන සාධාරණ ඉල්ලීම සමිති දෙකෙහිම එකඟතාවය මත කොමිෂන් සභාවේ නිර්දේශ, අදාළ පළාතේ, පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත ලබා දිය හැකි ය.

(ආ) වෙනත් පළාතක සමුපකාර සමිතියක සේවකයෙකු විසින් අදාළ පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාව මගින් ඉදිරිපත් කරනු ලබන ස්ථානමාරු ඉල්ලීමක් සම්බන්ධයෙන් සමුපකාර සමිති දෙකෙහිම එකඟතාවය හා අවශ්‍ය අනෙකුත් සුදුසුකම් සලකා බැලීමෙන් අනතුරුව අනුමත කළ හැකි ය.

(4) ඉහත (1), (2), (3) වගන්ති කොමිෂන් සභා අනුමත ස්ථිර සමුපකාර සේවකයින් සඳහා පමණක් අදාළ වනු ඇත.

22. මේ ප්‍රඥප්තියේ හෝ එය යටතේ සාදනු ලැබූ රෙගුලාසි හෝ කාර්යය පටිපාටි යටතේ සඳහන් විධිවිධාන අනුව හැර යම් සමුපකාර සමිතියක් විසින් ඒ සමුපකාර සමිතියේ කිසිම සේවකයෙකු සේවයෙන් පහකිරීම හෝ අන් ආකාරයකින් ඔහුට අදාළව දඬුවම් නොකල යුතු ය. සේවකයින් සේවයෙන් පහකිරීම සහ දඬුවම් පැනවීම.

23. (1) කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි යම් මුදලකට වැඩි මුදලක් ඇප වශයෙන් තබන ලෙස සමුපකාර සමිතියක් විසින් යම් සේවකයෙකුට නියම නොකළ යුතු ය. සමුපකාර සමිති සේවක ඇප.

(2) සමුපකාර සමිතියක යම් සේවකයෙකු විසින් තබන ලද ඇපයක් වූ යම් මුදලක් සමිතියේ නමින් රාජ්‍ය බැංකුවක තැන්පත් කළ යුතු අතර, එයට අයත් වන යම් පොළියක් වේ නම්, සේවයෙන් විශ්‍රාම ගිය විට දී හෝ සේවයෙන් ඉල්ලා අස් වන විට එය සේවකයාට ගෙවිය යුතු ය.

24. (1) මෙම ප්‍රඥප්තිය යටතේ කොමිෂන් සභාව විසින් සාදනු ලදුව අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන සෑම රෙගුලාසියක්ම *ගැසට් පත්‍රයක්* මගින් ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එය මෙම ප්‍රඥප්තිය යටතේ පනවනු ලැබූ මෙම ප්‍රඥප්තිය යටතේ විධිවිධානයක් හා සමානව වලංගු වුවා සේ සැලකිය යුතු අතරම ඊට අදාල වූ නීතිමය බලය තිබිය යුතු ය.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ පනවනු ලැබූ සෑම රෙගුලාසියක්ම මෙම ප්‍රඥප්තිය යටතේ විධිවිධානයක් සේ පිළිපැදීමට සමුපකාර සමිති හා ඒවායේ සේවකයෝ බැඳී සිටිය යුතු ය.

25. සේවා යෝජකයෙකු වන සෑම සමුපකාර සමිතියක්ම හා එහි සෑම සේවකයෙකු විසින්ම නීතියෙන් නියම කරනු ලැබිය හැකි වූ යම් මුදලක් වාර පතා දායක මුදල් සම්බන්ධයෙන් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට ඊට අදාල ලිඛිත නීතියට අනුව ගෙවිය යුතු ය. අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල.

26. සේවය ගන්නා ලද්දේ මෙම ප්‍රඥප්තිය පනවනු ලැබූ දිනයට පෙර වුව ද, පසුව වුව ද, සියළු සේවකයින් ඔවුන්ගේ සේවය ගන්නා ලද්දේ යම් සමිතියක් විසින් ද, ඒ සමිතියේ සේවකයන් බව ඒ සමිතියේ සේවයෙහි නියුක්ත බව හා ඒ සමිතියට පක්ෂපාත විය යුතු සේ සැලකිය යුතු ය. සමුපකාර සේවකයින් කොමිෂන් සභාවේ නොව සමිතියේ සේවකයින් බව.

III කොටස

**කොමසාරිස්වරයාගේ බලතල**

කොමසාරිස් විසින් සමිති වර්ගකළ යුතු බව හා කාර්ය මණ්ඩලය නිශ්වය කළ යුතු බව.

27\. (1) සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් සම්පාදනය කර ඇති වැටුප් ක්‍රම යටතේ එක් එක් සමුපකාර සමිතිය සඳහා සේවකයින්ගේ වර්ග හා ශ්‍රේණි අනුව සිටිය යුතු සේවකයින්ගේ සංඛ්‍යාව නිශ්වය කිරීම හා තමා සුදුසු යැයි සලකන අන්දමින් කලින් කල එය වෙනස් කිරීමේ බලය කොමසාරිස්ට තිබිය යුතු ය.

(2) (1) උපවගන්තිය යටතේ කොමසාරිස් විසින් කරනු ලබන නිශ්වය කිරීම කඩකරමින් කිසිම සමිතියක් විසින් කිසිම තැනැත්තෙකු සේවයට බඳවා නොගත යුතු ය.

වැටුප් ක්‍රම ආදිය පිළිබඳව කොමිෂන් සභාව කොමසාරිස්ගේ එකඟත්වය ලබා ගත යුතු ය.

28\. යම් පන්තියක හෝ යම් වර්ගයක යම් තනතුරකට හෝ තනතුරුවලට නියම කළ යුතු තනතුරට අදාල වැටුප් ක්‍රම නියම කිරීම ද, ඒ වැටුප් ක්‍රම කලින් කල ප්‍රතිශෝධනය කිරීම ද, කොමසාරිස්ගේ එකඟත්වය ඇතිව කොමිෂන් සභාව විසින් කළ යුතු ය.

IV කොටස

**විවිධ කරුණු**

කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ හා නිලධාරින්ගේ නිදහස.

29\. කොමිෂන් සභාව විසින් මෙම ප්‍රඥප්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, ගන්නා ලද යම් තීරණයක් හෝ කරන ලද හෝ නොකරන ලද හෝ යම් ක්‍රියාවක් හෝ සම්බන්ධයෙන්, කොමිෂන් සභාවේ සාමාජික පුද්ගලයෙකු හෝ කොමිෂන් සභාවේ ලේකම් හෝ කාර්ය මණ්ඩලයේ යම් නිලධාරියෙකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ නොකර හරින ලද හෝ යම් කාර්යයන් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් නොවිය යුතු ය.

ගිවිසුම්ගත හෝ අනියම් හෝ දවස් පඩි ගෙවන සේවකයන් සේවයේ යෙදවීම.

30\. (1) සමුපකාර සමිතියක් විසින් එහි ක්‍රියාකාරිත්වය වඩා කාර්යක්ෂම කිරීම පිණිස උපරිම මාස හයක කාලයක් සඳහා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ඇතිව ගිවිසුම් පදනමක් පිට යම් නිශ්චිත කාලයකට ප්‍රවීණයෙකුගේ හෝ විශේෂඥයෙකුගේ සේවය ලබා ගත හැකි ය.

(2) අනියම් හෝ දවස් පඩි ගෙවන සේවකයින් හෝ කෑලි පදනම පිට ගෙවන සේවකයින් උපරිම වශයෙන් මාස හයක කාලයක් සඳහා සේවයේ යොදවා ගැනීමට සමුපකාර සමිතියකට හැකියාව ඇත.

(3) ඉහත (1) සහ (2) යටතේ බඳවා ගනු ලැබූ කිසිදු සේවකයෙකු සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය නොමැතිව තනතුරේ ස්ථිර සේවයක් නොදිය යුතු ය.

(4) මෙම ප්‍රඥප්තියේ විධිවිධානයන්ට පටහැනිව යම් සමිතියක් විසින් සේවකයෙකු සේවයේ යොදවා ගැනීමේ දී සේවකයා වෙත පාරිශ්‍රමික හෝ දීමනා ගෙවා ඇත්තේ නම්, එසේ ගෙවනු ලැබූ සියලු මුදල් ගෙවීම් කිරීමට අදාළ වන වගකිව යුතු පාර්ශව වෙතින් අධිභාර මුදලක් වශයෙන් කොමසාරිස් විසින් අය කර ගත යුතු ය.

වැරදි හා දණ්ඩන

31\. (1) (අ) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන කඩකරන හෝ ;

(ආ) කරන ලෙස කොමිෂන් සභාව විසින් නියම කරන යම් ක්‍රියාවක් හෝ මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා කොමිෂන් සභාව හෝ යථා පරිදි බලය පවරනු ලැබූ අන් තැනැත්තෙකු සපයන ලෙස නියම කරන යම් තොරතුරක් සැපයීම ඕනෑකමින් ම නොසලකා හරින හෝ ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින හෝ,

(ඇ) ඕනෑකමින් ම අසත්‍ය වාර වාර්තාවක් ඉදිරිපත් කරන හෝ අසත්‍ය තොරතුරු සපයන

යම් සමුපකාර සමිතියක් හෝ එහි යම් නිලධරයෙකු හෝ සේවකයෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) එවැනි වරදක් සම්බන්ධයෙන් සමුපකාර සමිතියක අධ්‍යක්ෂ මණ්ඩලය හෝ එහි එක් එක් සාමාජිකයා හෝ එහි යම් නිලධාරියෙකු හෝ සේවකයෙකු හෝ සාමූහිකව හෝ පෞද්ගලිකව හෝ වගකීමට බැඳෙන්නේ ය.

(3) (1) උපවගන්තියේ සඳහන් යම් වරදක් කරන සෑම සමුපකාර සමිතියක් ම හෝ සෑම නිලධාරියෙක් ම හෝ සෑම සේවකයෙක් ම හෝ මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකට වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස්දහසකට නොඅඩු රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු වන්නේ ය.

(4) මෙම ප්‍රඥප්තිය යටතේ වූ යම් වරදක් සමුපකාර සමිතියක් විසින් කරනු ලැබූ අවස්ථාවක ඒ සමිතියේ සෑම නිලධාරියෙකු ම ඒ වරද කර ඇත්තේ තම දැනුම නොමැතිව බව හෝ ඒ වරද කිරීම වැළැක්වීම පිණිස නිසි සියලු උද්යෝගයෙන් තමා ක්‍රියා කළ බව ඔහු විසින් ඔප්පු කරගතහොත් මිස ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) කොමිෂන් සභාව විසින් දෙනු ලැබූ නියෝග කිසිවක් ක්‍රියාත්මක කිරීම පැහැර හැරීම පිළිබඳව යම් සමුපකාර සමිතියක් හෝ යම් නිලධාරියෙකු හෝ යම් සේවකයෙකු හෝ යම් සමුපකාර සමිතියක් වරදකරු කරනු ලැබූ විට එම සමුපකාර සමිතිය හෝ එම නිලධාරියා හෝ එම සේවකයා හෝ,

*(අ)* ඉහත (3) වැනි උපවගන්තිය යටතේ නියම කරනු ලබන යම් දඩයකට හෝ සිර දඬුවමකට හෝ එම දඬුවම් දෙකටම හෝ අතිරේකව ඒ වරද සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ පැහැර හැරීම ඉදිරියටත් පවත්වාගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් පන්දහසක දඩයක් ගෙවීමට හා,

*(ආ)* යම් සේවකයෙකු නැවත සේවය ගැනීමට නියම කරමින් කොමිෂන් සභාව විසින් දෙනු ලැබූ උපදෙස් කිසිවක් අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම පිළිබඳව වන විටක දී එකී සේවකයා නැවත සේවයේ පිහිටුවීමටත් සමුපකාර සමිතියක් ක්‍රියා කළ යුතු ය.

(6) ඒ එක් එක් දඩයෙහි හා කොමිෂන් සභාවේ උපදෙස් අනුව ඒ සේවකයා නැවත සේවයට බඳවා ගත යුතුව තිබූ දිනයෙන් ආරම්භව ඒ සමුපකාර සමිතිය වරදකරු කරනු ලැබූ දිනයෙන් අවසන් වූ කාල පරිච්ඡේදයේ එක් එක් දවසෙහි ඒ සේවකයා සේවයේ යෙදී සිටියේ නම් ඔහුට හිමිකම් තිබුණු වැටුපෙහි හෝ වේතනයෙහි ප්‍රමාණය අනුව ගණන් බලනු ලැබූ පාරිශ්‍රමිකය ඒ සේවකයාට ගෙවීමට යටත් විය යුතු ය. සමුපකාර සමිතියක් ගෙවීමට යටත් වන යම් මුදලක් ඒ සමුපකාර සමිතිය වරදකරු කරනු ලැබූ උසාවිය විසින් ඒ සමිතියට නියම කරනු ලැබූ දඩයක් ලෙස ඒ උසාවියේ ආඥාවක් පිට අය කර ගනු ලැබිය හැකි අතර, එසේ අය කර ගන්නා මුදල ඒ සේවකයාට ගෙවිය යුතු ය.

32. තම රාජකාරිය කිරීමේ දී හැර නියමින් හෝ අනියමින් තමා විසින් ම හෝ අන් තැනැත්තෙකු මාර්ගයෙන් හෝ කවර ආකාරයකින් හෝ කොමිෂන් සභාවේ යම් තීරණයක් කෙරෙහි හෝ යම් සාමාජිකයෙක් කෙරෙහි හෝ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකු කෙරෙහි බලපෑමක් කරන හෝ බලපෑමක් කිරීමට තැත් කරන සෑම තැනැත්තෙකු ම වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු එම වරදට වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස්දාහකට නොඅඩු රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයක් හෝ මාස හයකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කිරීමට හෝ එම දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය. කොමිෂන් සභාවේ කටයුතුවලට මැදිහත් වීම.

33. කොමිෂන් සභාවේ කිසිම සාමාජිකයෙකු, කොමිෂන් සභාවේ ලේකම්, කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ අන් කවර තැනැත්තෙකු විසින් වුව ද, තම නිල කාර්යයන් කිරීමෙහි ලා නොවන අන් ආකාරයකින් තමාගේ රාජකාරි ඉටු කිරීමේ දී තමාට දැන ගන්නට ලැබුණු කවර හෝ ලේඛනයක්, සංදේශයක් හෝ තොරතුරක් පළ කිරීම හෝ අන් තැනැත්තකුට හෙළිදරව් කිරීම නොකළ යුතු ය. බලය නොමැතිව තොරතුරු හෙළිදරව් කිරීම තහනම් බව.

34. කොමිෂන් සභාව හෝ යම් සාමාජිකයෙකු හෝ නිලධාරියෙකු හා යම් සමුපකාර සමිතියක් හෝ ඒ සමුපකාර සමිතියේ පාලන කාරක සභාවේ යම් සාමාජිකයෙකු හෝ එහි නිලධාරියෙකු හෝ කාර්යයන් අතුරෙන් යම් කාර්යයක් කිරීමෙහි ලා හෝ ඒ කාර්යය කිරීම සම්බන්ධයෙන් හුවමාරු වූ ලිඛිත හෝ වාචික යම් සංදේශයක් යම් නීති කෘත්‍යයක දී ඉදිරිපත් කරන ලෙස හෙළිදරව් කරන ලෙස එසේ ඉදිරිපත් කිරීමට හෝ හෙළිදරව් කිරීමට සභාපති ලියවිල්ලකින් කැමැත්ත දෙතහොත් මිස කිසිම තැනැත්තෙකුට අවසර නොදිය යුතු ය. නැතහොත්, බල නොකළ යුතු ය. කොමිෂන් සභාවේ සංදේශ වරප්‍රසාද යුක්ත බව.

සමුපකාර සමිති සහ එහි සේවා නියුක්තයන් සම්බන්ධයෙන් කාර්මික ආරවුල් පනත අදාළ වීම.

35. 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත යටතේ අභියාචනයක් කර ඇති අවස්ථාවකදී හෝ වෙනත් යම් කවර හෝ අධිකරණයක මීට අදාළ වූ කරුණක් විනිශ්චයට ලක් කරන අවස්ථාවක දී කොමිෂන් සභාව විසින් ඊට අදාළ අභියාචනයක් භාර නොගත යුතු ය.

අර්ථ නිරූපණය

36. මෙම ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස,

''පළාත'' යන්නෙන් බස්නාහිර පළාත ද,

''අමාත්‍යවරයා'' යන්නෙන් බස්නාහිර පළාතේ සමුපකාර සංවර්ධන විෂයභාර අමාත්‍යවරයාද,

''කොමසාරිස්'' යන්නෙන් බස්නාහිර පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිසට්‍රාර් ද,

''සමුපකාර සමිතිය'' යන්නෙන් සමුපකාර සමිතිවලට අදාළ නීතිය යටතේ ලියාපදිංචි සහ බස්නාහිර පළාත තුළ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යන, බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක වන සමිතියක්, සංගමයක්, මණ්ඩලයක් ද,

''දිස්ත්‍රික්කය'' යන්නෙන් අදහස් කෙරෙන්නේ බස්නාහිර පළාත තුළ පිහිටි කොළඹ දිස්ත්‍රික්කය, කළුතර දිස්ත්‍රික්කය හා ගම්පහ දිස්ත්‍රික්කයන් ද,

''නිලධාරියා'' යන්නෙන් සමිතියක, සංගමයක, මණ්ඩලයක හෝ එහි යම් ශාඛාවක සභාපතිවරයා, උප සභාපතිවරයා, ලේකම්වරයා, භාණ්ඩාගාරිකවරයා හෝ සමිතියක කාරක සභාවක සාමාජිකයෙකු, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු සහ සමිතියේ කටයුතු සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීමට සමිතියේ කාරක නියෝගවලින් හෝ අතුරු ව්‍යවස්ථාවලින් බලය පවරනු ලැබූ අන් කිසි තැනැත්තෙකු ද,

''සේවකයා'' යන්නෙන් මෙම ප්‍රඥප්තියේ අර්ථානුකූලව සමුපකාර සමිතියක සේවකයෙක් යන්න ද, අදහස් වන්නේ ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

37. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**උපලේඛනය 01**

*කොමිෂන් සභාවේ සභාපති/සාමාජිකයෙකු විසින් කළ යුතු දිවුරුම් ප්‍රකාශය*

................................................................................................................................................ වන මම, බස්නාහිර පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති/සාමාජිකයෙකු වශයෙන් පත් කිරීම හේතු කොට ගෙන බස්නාහිර පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති/සාමාජික වශයෙන් එම තනතුරේ අපක්ෂපාතීව, භීතියකින්, හිතවත්කමකින් හෝ ද්වේශයකින් තොරව ඉටු කරන බවත්, එසේ කිරීමේ දී ඊට අයත් කිසිම කරුණක් ගැන කිසිම දෙයක් රාජකාරියට විනා වෙනත් පුද්ගලයෙකුට කෙලින්ම හෝ වක්‍රව අනාවරණය නොකරන බවට මෙයින් ගරු ගාම්භීරව/දිවුරා ප්‍රකාශ කර සිටිමි. / ප්‍රතිඥ දෙමි.

....................................................

20........ ක් වූ .............. මස ........... වැනි දින මා ඉදිරියේ දී දිවුරා ප්‍රකාශ කරන ලදී.
ප්‍රතිඥ දෙන ලදී.

අධිකරණයේ විනිශ්චයකාරතුමා

**උපලේඛනය 02**

*කොමිෂන් සභාවේ නිලධාරියෙකු විසින් කළ යුතු දිවුරුම් ප්‍රකාශය*

...................................................................................................................................................................... වන මම, බස්නාහිර පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්/නිලධාරියෙකු වශයෙන් රාජකාරි කටයුතු ඉටු කිරීමට නියම වීම කරණ කොටගෙන එම ලේකම්/ නිලධාරි තනතුරේ රාජකාරි කටයුතු ඉටුකිරීමේ දී රාජකාරියට අදාළව විනා, වෙනත් කවර විටක දී හෝ කවර ආකාරයක හෝ

කරුණක් හෝ එහි කිසිම කොටසක් කිසිම පුද්ගලයෙකුට කෙලින්ම හෝ වක්‍රව අනාවරණය නොකරන බවට මෙයින් ගරු ගාම්භීරව/ දිවුරා ප්‍රකාශ කර සිටිමි./ ප්‍රතිඥා දෙමි.

.....................................................

20........ ක් වූ ............. මස ........... වැනි දින මා ඉදිරියේ දී දිවුරා ප්‍රකාශ කරන ලදී.
ප්‍රතිඥා දෙන ලදී.

සභාපති,
බස්නාහිර පළාතේ, සමුපකාර සේවක කොමිෂන් සභාව.

11 - 1218

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.